# 1

# වීදියබණ්ඩාර රජු මාඝාතය පැන වූ නාථගනේ ශිලාලේඛනය

**මන්දාරම්නුවර චන්දානන්ද හිමි**
**කරුණාසේන හෙට්ටිආරච්චි**

කුරුණෑගල වාරියපොළ මාර්ගයෙහි කුරුණෑගල සිට කිලෝ මීටර් 9ක් පමණ ගියතැන හමුවන **මහකෙළිය** හන්දියෙන් වම් පසට වැටී ඇති **කටුපොත** මාර්ගයෙහි මදක් දුර ගමන් කොට **කටුපිළියෑව** මං සන්ධියෙන් නාථගනේ මාර්ගයෙහි ගමන් කිරීමෙන් **නාථගනේ** විහාර භූමියට පැමිණිය හැකිය. ඉහත මාර්ගයට අමතරව **කුරුණෑගල** සිට **වාරියපොල** දෙසට පැමිණෙන විට හමුවන **හංහමුණුව** මංසන්ධියෙන් වමට හැරී **කළුගමුව** මාර්ගය ඔස්සේ ඉදිරියට පැමිණෙන විට හමුවන **කොස්ගහමුල** මංසන්ධියෙන් දකුණට හැරී පැමිණීමෙන් ද මෙම ස්ථානයට ලඟා විය හැකිය. එය ගල් පර්වත සහිත පැතිරුණු උස් භූමියකි. මෙහි මූල බ්‍රාහ්මී ලිපි සහිත ලෙන් 4ක් ඇත. මේවායෙන් දෙකක් සෙනරත් පරණවිතාන විසින් පළකොට ඇත (Paranavitana 1970:no 911, 912).මේ හැර මෑත කාලයෙහි මධ්‍යම සංස්කෘතික අරමුදල මගින් කරන ලද කැනීම්වල දී අනුරාධපුර සමයට අයත් ශිලාලේඛන 2ක් අනාවරණය විය. අක්ෂර ලක්ෂණවලට අනුව මේවා 5වන සියවසට පමණ අයත් වේ. මේ හැර කෝට්ටේ සමයට අයත් ගිරි ලිපියක් ද හමු වී ඇත. අවසනට සඳහන් කළ කෝට්ටේ සමයට අයත් ගිරි ලිපිය පිළිබඳව මෙම ලිපියෙන් කරුණු අධ්‍යයනය කෙරේ.

මෙම ශිලා ලේඛනය පිහිටි ස්ථානයෙහි ගෝලීය ස්ථානගත පිහිටීම උතුරු අක්ෂාංශ 07° 56’ 476,නැගෙනහිර දේශාංශ 80° 27’ 974 හා මධ්‍යයන මුහුදු මට්ටම් උස අඩි 443ක්පමණ වේ. විහාර භූමියෙහි මදක් කන්ද නැගගත් පසුව හමුවන නව ආවාස ගොඩනැගිල්ලට වම් පසින් වූ ගල් පර්වතයේ අඩි 3 අඟල් 8ක් පමණ ධිගට හා අඩි 3 අඟල් 3ක් පමණ පළලට විහිදෙන සේ අක්ෂර පේළි 7ක් වශයෙන්

කෙටුම්පත් කර ඇත. එක් අකුරක ප්‍රමාණය අඟල් 4ක් පමණ වේ. අක්ෂර පේළි ගනකම් රේඛාවකින් කොටුකර දක්වා ඇත. එමකොටුවට පිටතින් ලිපියේ ආරම්භක පැත්තෙහි චන්ද්‍ර සලකුණක් හා ඊට සමාන්තරව ප්‍රතිවිරුද්ධ පැත්තෙහි සූර්ය සංකේතයක් සටහන්ව ඇත. එය අඟල් 10ක් පමණ විශාලත්වයෙන් යුතුය. අකුරු සටහන් කිරීම සඳහා මදක් ගැඹුරු ඇලි භාවිත කොට ඇත. අක්ෂර සටහන් කළ තැනැත්තා දක්ෂ ගල් වඩුවෙකු බව සහ අක්ෂර පිළිබඳ දැනුමකින් යුක්ත අයෙකු බව නොපෙනේ. මෙම ශිලාලේඛනය මෙතෙක් පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ පිළිගත් කෘතියක සම්පූර්ණ පෙළ සහිතව පළකොට නොමැත. එහෙත් පරණවිතාන විසින් 1933 වර්ෂයේ දී ලංකා විද්‍යාත්මක සඟරාවේ අංක **717** යටතේ සුළු සටහනක් පමණක් ඉදිරිපත්කොට ඇත (CJS 1933: Vol. ii, Part 3,221). පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව සතු ලියාපදිංචි ලේඛනය පරීක්ෂා කිරීමේ දී මෙම ලිපිය 1932 වර්ෂයේ දී පිටපත් කළ බව වාර්තාකර තිබිණි. 1965වර්ෂයේ දී මෙම ලිපිය පිළිබඳව කරුණු ඉදිරිපත් කරන **දෙගම්මැද සුමනජෝති** හිමියන් තම ලිපියක මෙබඳු සටහනක් තබා ඇත.

> *ස්වාභාවික හේතූන් නිසා ලිපියෙන් සැහෙන කොටසක් කියවාගත නොහැකි තත්වයකට පත්ව ඇත. ඒ නිසාම වරක් පුරාවිද්‍යා අධිකාරි මහාචාර්ය සෙනරත් පරණවිතාන සූරීන් විසින් මෙම ලිපිය පිටපත්කර ගත්ත ද එතරම් සාර්ථක නොවීය. නොනැසී තිබෙන කොටස මෙසේය.* ***-----ශ්‍රී බුවනෙකබාහු අදහසට වීදියේ අදහසට ධම්පාල අදහසට ------- ට පිනට ------*** (සුමනජෝති හිමි 2005: (දෙවන මුද්‍රණය)13)

උන්වහන්සේට අනුව පරණවිතානයන්ට මෙම ලිපිය සම්පූර්ණයෙන් කියවා ගැනීමට හැකියාව ලැබී නැත. ඉදිරිපත්කොට ඇති කොටසෙහි පෙළ ද වරද සහගතය. මුල් ශිලා ලිපියෙහි ***ශ්‍රී බුවනෙකබාහු වීදියේ අදහසට*** යනුවෙන් මිස ***ශ්‍රී බුවනෙකබාහු අදහසට වීදියේ අදහසට*** යනුවෙන් ***අදහසට*** යන පදය දෙවරක් යෙදී නැත.

මෙම ලිපිය පූර්ණ පෙළ සහිතව පළමු වතාවට **1993** වර්ෂයේ දී **ඇන්.ටී. කරුණාතිලක** විසින් තම කෘතියක පළකොට ඇත. එම ලිපියේ පෙළ තමා නාථගනේ විහාරාධිපති **රත්කරව්වේ නාහිමියන්ගෙන්** පිටපත් කරගත් බව සඳහන්කර ඇත (කරුණාතිලක 1993:86). මෙම ලිපිය උන්වහන්සේට කවරෙකු විසින් කියවාදෙන ලද්දේදැයි දැන ගැනීමට මාර්ගයක් නොවුණි. **රත්කරව්වේ** නාහිමි දැනට අපවත්ව සිටින අතර වර්තමානයේ එහි වැඩවසන ස්වාමීන්වහන්සේලා ඒ ගැන යමක් කීමට ද නොදනිති. මෑතදී සංස්කරණයකොට

ඇති **කුරුණෑගල විස්තරය** නම් ශාස්ත්‍රීය ග්‍රන්ථයෙහි ද දෙගම්මැද සුමනජෝති හිමියන්ගේ උපුටනය ම දක්වා ඇත (කුරුණෑගල විස්තරය 2015:113). මේ හැර 2015 වර්ෂයේ දී සිරිමල් රණවැල්ල අසිරිමත් කෝට්ටේ යන ශාස්ත්‍රීය සංග්‍රහයට ලිපියක් සපයමින් සත්වන බුවනෙකබාහු රජුගේ ලිපි යටතේ නාථගනේ සෙල්ලිපියෙහි නිවැරදි පෙළ ඉදිරිපත්කොට ඇත. එහෙත් එහි කිසිදු අර්ථ විවරණයක් හෝ පරීක්ෂාවට බඳුන් කිරීමක් නොමැත (රණවැල්ල 2015:759). නාථගනේ සෙල්ලිපිය සොයාගෙන වසර 80ක් ඉක්ම ගිය අවස්ථාවේ හෝ එය පරීක්ෂාවට ලක්කිරීම සුදුසු බව පෙනිණි.

ලිපියේ පෙළ

**1 ශ්‍රී බුවනෙකබාහු**
**2 වීදියෙ අදහසට**
**3 ධම්මපාල අදහසට**
**4 කඳුරුගම ආරච්**
**5 චිට පිනට දේවො මැදි**
**6 කෝරලයෙ වඳුරන් රි**
**7 ළවුන් වවුලන් නොමරත්වා**

අර්ථ

**ශ්‍රී බුවනෙකබාහු වීදිය බණ්ඩාර උතුමන්ට ධම්මපාල උතුමන්ට කඳුරුගම ආරච්චි (යන අයට) පින් ලැබීම පිණිස දේවමැදි කෝරළයෙහි වඳුරන් රිළවුන් වවුලන් නොමරනු ලබත්වා**

මෙම ලිපිය පිහිටුවීමේ අරමුණ වී තිබෙන්නේ **වීදිය බණ්ඩාර** රජු, **ධර්මපාල** රජු සහ **කඳුරුගම ආරච්චි** ඇතුළු පිරිසට පින් පිණිස සත්ත්ව ඝාතනය නොකරන ලෙස දැන්වීම සඳහාය. මෙම ලිපියෙහි අන්තර්ගත කරුණු ලංකාවේ ශිලාලේඛන අතර දුර්ලභ ගනයේ ඒවා වෙයි. වීදිය බණ්ඩාර හා කෝට්ටේ රජකළ ධර්මපාල කුමරු ආදීන් පිළිබඳව සඳහන් වන මෙතෙක් හමුව ඇති එකම ශිලාලේඛනය මෙය වීමත් එසේම **වඳුරන්, රිලවුන්** සහ **වවුලන්** නොමැරිය යුතුය යන මාඝාත ආඥාව පැනවූ ලංකාවේ එකම ශිලාලේඛනය වීම ද විශේෂත්වයකි. ඒ අනුව මෙහි එන චරිත හා අන්තර්ගතය පිළිබඳව විමසා බැලීම යෝග්‍ය වෙයි.

***ශ්‍රී බුවනෙකබාහු වීදියෙ අදහසින් :*** මෙහි මුලින් සඳහන් වන **ශ්‍රී බුවනෙකබාහු** යනු පරණවිතානට අනුව කෝට්ටේ රජ කළ හත්වන බුවනෙකබාහු (1521-1551)රජුය (CJS 1933: Vol. ii, Part 3,221). එසේ වන්නේ නම් මූලාශ්‍රය සාධකවලට අනුව ඔහු හත්වන විජයබාහු (1508-1521) රජුගේ පුත්‍රයෙකි. විජයබා රජු කුමන්ත්‍රණකාරී ලෙස 1521 දී ඝාතනය කෙරුණි. මෙය රාජාවලිය හඳුන්වා ඇත්තේ **විජයබා කොල්ලය** යනුවෙනි (රාජාවලිය 1997:266). මෙම ඝාතනය සාහසික එකක් වූ අතර එය සැලසුම් කළ දේශපාලන ඝාතනයකි. විජයබා රජුගේ පළමු පුත්‍රයා වන **බුවනෙකබාහු කෝට්ටේ** ද දෙවන පුත්‍රයා වූ **රයිගම් බණ්ඩාර රයිගම** ද තුන් වැන්නා වූ **මායාදුන්නේ සීතාවක** ද පාලන බලය ගෙන ගොස් ඇත. මෙම ලිපියෙහි සඳහන් **ශ්‍රී බුවනෙකබාහු** යනු හත්වන විජයබාහුගේ පුත්‍ර බුවනෙකබා ලෙස ගැනීම දුෂ්කර ය. මෙහි එන **අදහසින්** යන පදය යෙදී ඇත්තේ කෝට්ටේ සමයේ ශිලාලේඛන කීපයක හා එම සමය විස්තර කරන මූලාශ්‍රය කීපයක පමණි. මහාචාර්ය **ඒ. වී. සුරවීර** රාජාවලිය කෘතිය සංස්කරණයේ දී එහි ගැටපද විවරණයෙහි **අදහසින්** යන පදය රාජකීයයන් සඳහා යෙදෙන ගෞරව පදයක් ලෙස දක්වා ඇත (රාජාවලිය 1997:280). මෙම පදය රාජකීය ස්ත්‍රී පුරුෂ දෙපක්ෂය සඳහාම යෙදී ඇත. එනම් **වීදියෙ අදහසින්** (එම:228) **තම්මිට අදහසින්** (එම:229) **බිසෝ අදහසින්** (එම:231) වශයෙනි. සුමංගල ශබ්දකෝෂයෙහි ද මෙම අදහසම දක්වා ඇත (සෝරත හිමි 1963:280). මෙහි නිරුක්තිය අපැහැදිලි බව සුරවීර වැඩිදුරටත් සඳහන් කරයි (රාජාවලිය 1997:280). **කුරුණෑගල විස්තරය** නම් මූලාශ්‍රයයෙහි ද **වීදියෙ අදහසින්, මායාදුන්නේ අදහසින්, නිකපිටි අදහසින්, තිඹිරිපොළ අදහසින්,** යනුවෙන් රාජකීයයන් හැඳින්වීමට මෙම පදය යොදාගෙන ඇත (කුරුණෑගල විස්තරය 2015:275). මේ අනුව **අදහසින්** යන පදය රජ කෙනෙකු, බිසවක හෝ රාජකීයයෙකු හැඳින්වීමට භාවිත වූ බව පැහැදිලි වේ.

බුවනෙකබාහු රජුට අයත් **ගනේගොඩ තඹ සන්නස, මහනුවර දිසා අධිකරණ හිම්පත, වටිනාපහ පුවරු ලිපිය, පල්කුඹුර සන්නස** ආදියෙහි එම රජු හඳුන්වා ඇත්තේ **සිරිසඟබො ශ්‍රී බුවනෙකබාහු චක්‍රවර්ති ස්වාමීන් වහන්සෙ** හෝ **සිරිසඟබො ශ්‍රී බුවනෙකබාහු මහරජාණන් වහන්සෙ** යනුවෙනි (රණවැල්ල 2015: 753-759). එබැවින් නාථගනේ ශිලාලේඛනය සත්වන බුවනෙකබා රජුට අයත් වන්නේ නම් ඔහුගේ නම එහි **ශ්‍රී බුවනෙකබාහු** යනුවෙන් පමණක් සඳහන් කරනු ඇතැයි සිතිය නොහැකිය. අඩුතරමින් **ශ්‍රී බුවනෙකබාහු අදහසින්** යනුවෙන් වත් යෙදිය යුතුය. මෙහි ඉතා පැහැධිළි ලෙසින් **ශ්‍රී බුවනෙකබාහු වීදිය අදහසින්** යනුවෙන් යෙදී තිබීමෙන් **ශ්‍රී බුවනෙකබාහු** යන පදය **වීදිය අදහසින්** යන්නට විශේෂණයක් ලෙස නැතහොත් අභිධානයක් ලෙස යෙදුනු බව සිතීමට පුළුවන. ලිපියේ අක්ෂර ලක්ෂණ අන්තර්ගත අනෙක් කරුණු සමග සසඳන කල මෙහි සඳහන් **ශ්‍රී බුවනෙකබාහු වීදිය අදහසින්** යනු, අන් කවරකු වත් නොව කෝට්ටේ

සමයේ ජීවත් වූ අභීත රණකාමියෙකු වූ වීදිය බණ්ඩාර බව පැහැදිළිය. රාජාවලියෙහි ද වීදිය බණ්ඩාර හඳුන්වන කීප ස්ථානයක ම **වීදියේ රජ** යන යෙදුම භාවිතකර තිබීම ද මෙම නිගමණය සනාථ කරන්නකි (රාජාවලිය 1997:230,231). ඔහු **මාදම්පේ** සිටි **තනියවල්ලභ** රජුගේ දියණියක වූ **සමුද්‍රදේවී** නම් කුමරියට සොලී කුමරෙකු නිසා උපන් දරුවෙකු බව එම ග්‍රන්ථයෙහි ම සඳහන්ය (එම:228). වීධීය බණ්ඩාරට **තම්මිට බණ්ඩාර** නමින් සොයුරකු ද විය. වැඩිමහල් වීදිය බණ්ඩාර කුමාරයාට කෝට්ටේ පාලකයා වශයෙන් කටයුතු කරමින් සිටි බුවනෙකබාහු රජුගේ දියණියක විවාහ කර දී ඇත. ඇය **සමුද්‍රදේවී** නම් වූවා ය. (වීදිය බණ්ඩාරගේ මවගේ නම ද සමුද්‍ර දේවී නම් විය) මෙය සම කාලීනව කෝටටේ පැන නැගී තිබුණු දේශපාලන වියවුල් තත්වයට ද පිළියමක් ලෙස ගත් තීරණයක් ද විය හැකිය. පෘතුගීසිහු මේ වන විට කොළඹ බලය අල්ලාගෙන තිබූ අතර සීතාවක හා රයිගම කෝට්ටේ පාලකයා සමග ද ගැටුම් ඇති කොට ගෙන තිබුණි. වීදියබණ්ඩාර මුල් සමයේ දී තම මාමණ්ඩිය වූ බුවනෙකබාහු රජු සමග බොහෝ මිත්‍රශීලීව කටයුතු කළේය. තමන්ගේ වැඩිමහල් පුත්‍ර ධර්මපාල කුමාරයා ද බුවනෙකබාහු රජුට භාර කරන ලදී. ඒ අනුව ධර්මපාල කුමරු කෝට්ටේ රජ මාලිගාවේ හැදී වැඩුණි. බුවනෙකබාහු ගෙන් පසු කෝට්ටේ පාලකයා ලෙස ධර්මපාල කුමරු පත් කිරීමට ඔහු දැඩි ආශාවකින් පසු වූ අතර ධර්මපාල කුමාරයාගේ රනින් කළ පිළිමයක් **ලිස්බන් නගරයේ** විසූ පෘතුගීසි රජු වෙත යවා එය අභිෂේක කරවනු ලැබීය. මෙහි දී කුමරාගේ ආරක්ෂාව පෘතුගීසින් වෙත පැවරීමටත් වර්ෂයක් පාසා තැගි භාණ්ඩ දීම ආදි කරුණු ගණනාවකට දෙපාර්ශවය අතර එකඟ වී ඇත. මෙම තත්ත්වය පෘතුගීසින්ට වාසි සහගත විය.

මේ අතර රයිගම රජ කළ රයිගම් බණ්ඩාර කුමරු 1538 දී හධීසි රෝගාබාධයකින් මරණයට පත් වූ අතර එම ප්‍රදේශය මායාදුන්නේ විසින් සීතාවක රාජ්‍යයට ඈඳා ගන්නා ලදී. ඒ හේතු කොට ගෙන සීතාවක හා කෝට්ටේ රජු අතර පැවති බල අරගලය ද උග්‍ර විය. දෙ පිරිස ම වරින්වර එකිනෙකා යටත් කර ගැනීමට වෙර දරමින් සිටියහ. අවස්ථා ගණනාවක දී දරුණු යුධ ගැටුම් ද ඇති විය. කෝට්ටෙන් සිදු කළ ඇතැම් ආක්‍රමණවලට වීදිය බණ්ඩාරගේ ද සහාය ලැබුණි. මෙසේ කල් ගෙවන අතර **1551** දී සත්වන බුවනෙකබාහු රජු කැලණියේ ගං ඉවුරේ සකසා තිබූ මාලිගාවක සීමැදුරු කවුළුවකින් පිටත බලමින් සිටිය දී පෘතුගීසි සොල්දාදුවෙකු විසින් තැබූ වෙඩි පහරකින් මැරී වැටුණි. මෙය අත් වැරැද්දක් ද කුමන්ත්‍රණයක්දැයි පැහැදිලි නැත. රාජාවලිය මෙය වාර්තා කර ඇත්තේ, *මෙම වෙඩි තැබීම හිතාමතා කරන ලද්දක් ද හෝ වැරදීමකින් සිදුවීදැයි දෙවියන් පමණක් දනී* යනුවෙනි (රාජාවලිය). පෘතුගීසි වාර්තාකරුවකුවන රිබෙයිරෝගේ වාර්තාවලට අනුව බුවනෙකබාහු ඝාතනය අවස්ථාවෙහි වීදිය බණ්ඩාර ද කැලණි මාලිගාවෙහි සිට ඇත. මෙම ඝාතනයෙන් පසුව ඔහු හට හමුදාවත් සමග කෝට්ටේට පැමිණ

ඇත. අනතුරුව ධර්මපාල කුමරු බලයට පත් කෙරුණු අතර වීදිය බණ්ඩාර බුවනෙකබා රජුගේ මරණින් පසු ධර්මපාල කුමරුට උපකාර කරමින් සිට ඇත. කෙසේ වෙතත් තම පුත්‍ර ධර්මපාල කුමරු ක්‍රිස්තු ආගම වැළඳ ගැනීමත් පෘතුගීසින් සමග සහයෝගයෙන් කටයුතු කිරීම පිළිබඳවත් අකමැත්තෙන් පසුව ඇත. එහෙත් තම පුත්‍රයාට සහය පතා ඔහු පෘතුගීසින් සමග සීතාවක රාජ්‍ය යටත් කිරීමේ සටනට ද ගොස් ඇත. මෙම සටන කිරීම වෙනුවෙන් පෘතුගීසින් විසින් විශාල මුදලක් ධර්මපාල කුමරාගෙන් ඉල්ලා සිටීම හේතු කොට ඊට විරෝධය පෑමක් ලෙස ඔහු ධර්මපාල කුමරු අතහැර වෙනත් ස්ථානයකට ගිය බැව් පෙනීයයි. **රෙබෙයිරෝ** සඳහන් කරන්නේ ඔහු තමාගේ මස්සිනා රජ කළ සත් කෝරළයට ගිය බවය (රිබෙයිරෝ 2003:32). මේ වන විට **සත්කෝරලයේ දේවමැද්දේ මුණ්ඩකොණ්ඩපොළ** නුවරක් ඉදිකර **එදිරිමාන්න සූර්ය** නම් රජෙකු පාලනය ගෙන ගොස් ඇත. මුණ්ඩකොණ්ඩපොළ යනු වර්තමාන නාථගනය යැයි උගතුන් විසින් පිළිගෙන ඇත (රාජාවලිය 1997: 87).

ඇතැම්විට මේසමයේ දී සත් කෝරළයේ රජුගේ දියණියක වීදියබණ්ඩාර විසින් ධර්මපාල කුමරුට විවාහ කරදීම හේතුවෙන් උක්ත ඥාතීත්වය ගොඩ නැගුණු බව රිබෙයිරෝ වාර්තාවෙන් පෙනීයයි (රිබෙයිරෝ 2003:35). වෙනත් මූලාශ්‍රයවල මෙම කරුණ වාර්තා වී නොමැත. මෙම නව මිත්‍රකම් ගොඩ නැගීම් පෘතුගීසීනට අවාසි සහගත වීමට ඉඩ තිබූ නිසාවෙන් ඔව්හු උපක්‍රමශීලී ලෙස වීධියබණ්ඩාර කෝට්ටේ රජ මාලිගාවට කැඳවා පෘතුගීසීන් විසින් ඔහු අත් අඩංගුවට ගනු ලැබුණි (රාජාවලිය 1997:230). ධර්මපාල කුමරු පෘතුගීසීන් ගේ රැකඩයෙකු වූ නිසා තමාගේ පියා අත්අඩංගුවට ගැනීමට විරුද්ධව කටයුතු කිරීමට නොහැකි වන්නට ඇත. රාජාවලිය මෙම අත්අඩංගුට ගැනීමට හේතු කාරණාව ලෙස දක්වා ඇත්තේ වීධියබණ්ඩාර මායාදුන්නේගේ දියණියක විවාහ කරගත් නිසා බවය (එම: 230). එහෙත් මේවන විට මායාදුන්නේගේ දියණිය විවාහකොට නොගෙන සිටිබව පත්මසිරි කන්නන්ගර හේතු සහිතව පෙන්වා දී ඇත (2014:22-40). අත්අඩංගුවට ගැනීමෙන් පසුව වීදියබණ්ඩාර දම්වැල්වලින් බැඳ කොළඹ කොටුවේ වෙඩි බෙහෙත් ගබඩාවක සිරකොට තබා ඇත (රිබෙයිරෝ 2003:32). මෙය 1553 දී පමණ සිදුවන්නට ඇතැයි සිතිය හැකිය. මෙම අවස්ථාවේ දී ඥානාන්විතව කටයුතු කළ **සමුද්‍රදේවී** කුමරිය පොළොව යටින් උමගක් කපා ඔහුට සිර කුටියෙන් පැන යාමට උපකාර කරණු ලැබුවාය (රාජාවලිය 1997:231). මොහු පැනගොස් රයිගම් කෝරළයේ **අටුළුගම** නැවතී සිට ඇති අතර පෘතුගිසි හමුදාවන්ගේ තාඩන පීඩන හේතුවෙන් ඔහු කළු ගඟින් එතරව පැලැඳ බලකොටුවක් ඉදිකර සිට ඇත (එම: 231). මෙහි වසන සමයෙහි වීදියබණ්ඩාරගේ බිරිඳ වූ සමුද්‍රදේවිය කිසියම් රෝගයකින් මියගොස් ඇත. එය 1554වර්ෂයේ දී සිදුවූ බව කන්නන්ගර පෙන්වා දෙයි (2014:34). ඇයගේ මරණයෙන් පසුව වීදියබණ්ඩාර

මායාදුන්නේගේ වැන්දඹු දියණියක වූ **මහ ටිකිරිබණ්ඩාර** හෙවත් **සූරියදේවිය** විවාහ කරගෙන ඇත. මෙම විවාහය මගින් තම බල ප්‍රදේශයට පැමිණි රණශූර වීදියබණ්ඩාර තමාට නතුකර ගැනීමට මායාදුන්නේ උත්සාහ කළා වීමට පුළුවන. පෘතුගීසින් ඔවුන්ගේ මෙම සබඳතාව බිඳ දැමීමට විවිධ උපක්‍රම භාවිත කරන්නට ඇත. මෙහි අවසාන ප්‍රතිඵලය වූයේ වීදියබණ්ඩාරට විරුද්ධව මායාදුන්නේ පැළෑඳ බලකොටුව ආක්‍රමණය කිරීමය. රාජාවලිය සඳහන් කරන්නේ වීධීයබණ්ඩාර මායාදුන්නගේ දියණිය වූ සූරියදේවියට නොසලකා හැරීම හා කරන ලද තාඩනපීඩන හේතුවෙන් ඇය බේරා ගැනීමට පැළෑඳ බලකොටුව ආක්‍රමණය කළ බවකි (රාජාවලිය 233). වීදියබණ්ඩාර පැළෑඳ සිටියදී අභිධානයක් ලෙස **තුට්ටරායකණ්ඩ ඒකංගවීර** යන්න භාවිත කළ බව රාජාවලිය සඳහන් කරයි (රාජාවලිය 1997:233). **අලකේශ්වර යුද්ධය** කෘතියෙහි **තනියාවල්ලන් මදියාත්‍රමන්ත්‍රන්** යන විරුද නාමය භාවිත කළ බව දක්වයි (අලකේශ්වර යුද්ධය 2009:37). පැළෑඳ බලකොටුවට පහරදීම හේතුවෙන් වීදියබණ්ඩාර ඉන් පැනගොස් උඩරට පාලකයා වෙත ගියේය. මේ වන විට **කරල්ලියැද්දේ බණ්ඩාර** උඩරට පාලනය කරමින් සිටියේය. සීතාවක මායාදුන්නේ වීධීය බණ්ඩාරට උදව් නොකරන ලෙස කරල්ලියැද්දට දන්වූ අතර එසේ කළහොත් උඩරට ආක්‍රමණය කරන බැව් දන්වීය (රාජාවලිය 1997:234). මේ බව දැනගත් වීදියබණ්ඩාර උඩරටින් පලාවිත් සත් කෝරළයේ **දේවමැධී පත්තුවේ මුණ්ඩකොණ්ඩපොළට** පැමිණියේය. මීට පෙර අවස්ථාවක දී ද මොහු රැකවරණය පතා මෙහි පැමිණිබව ඉහත පෙන්වා දී ඇත. මේ වන විටත් එහි **එධිරිමානසූරිය** නැතහොත් **ඉරුගල් බණ්ඩාර** පාලකයා වශයෙන් කටයුතු කරමින් සිටියේය. වීදියබණ්ඩාර ඇතුළු පිරිසට ඔහු විසින් නවාතැන් දෙනු ලැබූයේ **බෝගොඩ** නම් ගමෙහි ය (එම:234). මෙසේ නවාතැන් ගෙන සිටිද්දී ඔහු විසින් කුමන්ත්‍රණය කොට **වේලායුද ආරච්චියා** ලවා එදිරිමාන්නසූරිය රජු මරවා එහි රාජ්‍ය බලය ලබාගත් බව රාජාවලිය හා රිබෙයිරෝ වාර්තා කර ඇත. රිබෙයිරෝ මෙය වාර්තා කර ඇත්තේ *කළ ගුණ නොදත් කුමාරයා ඔහුට උපකාර කළ අය එක් රාත්‍රියක දී මරා ඔහුට අයත් වස්තුව හා මාලිගය අත්පත් කර ගත්තේය,* යනුවෙනි (රිබෙයිරෝ 2003:35). මෙයින් පෙනෙන්නේ වීධීයබණ්ඩාර සත් කෝරළයේ රජු බවට පත් වූ බවය. මෙසේ පාලකයා බවට පත් වූ සමයෙහි දී ඔහු **ශ්‍රී බුවනෙකබාහු** යන අභිධානය තම නමට ඈඳා ගන්නට ඇතැයි සිතීමට පුළුවන. ඔහු විසින් නාථගනේ මෙම ශිලාලේඛනය පිහිටුවන්නට ඇත්තේ රාජ්‍ය බලය ලබාගත් එම සමයේ දී වීමට පුළුවන. ඉහත දැක්වූ පරිදි ඔහු පැළෑඳ පාලකයාව සිටිය දී ද අභිධාන භාවිත කළ බව පැහැදිළි විය.

***ධම්මපාල අදහසින් :*** මින් අදහස් කොට ඇත්තේ වීදිය බණ්ඩාරගේ පුත්‍ර ධර්මපාල කුමාරයාය. ඉහත විස්තර කළ පරිධී ඔහුගේ මව වූයේ සමුද්‍රදේවී කුමරියයි. මෙම කුමරු 1539 දී උපන්බව විශ්වාසකෙරේ.ඔහු තම මුත්තණුවන් වූ බුවනෙකබාහු රජු සමීපයෙහි හැදී වැඩුණි. ධර්මපාල කුමරුට පෘතුගීසි පූජකයෙකු ලවා පෘතුගීසි භාෂාවත් ක්‍රිස්තු ධර්මයත් ඉගැන්වූ බවට තොරතුරු ඇත. රාජාවලියෙහි මෙම කරුණ වාර්තා කර ඇත්තේ *ධර්මපාල රජු දක කතා කරගෙන ක්‍රිස්තු සමයම ධර්මපාල රජුට දී දොන් ජීවන් පෙරියපන්දාර් කියන නමින් කුලවද්දාගෙන* යනුවෙනි (රාජාවලිය 1997:230). ලංකා ඉතිහාසයෙහි ලාංකික රජ කෙනෙකු ප්‍රසිද්ධියේ කිතු දහම වැළඳගත් පළමු අවස්ථාව මෙය විය. ඔහු 1580 දී තමාගේ මරණයෙන් පසු සිංහල රාජ්‍ය පෘතුගාලයේ **දොන් මැනුවෙල්** රජුට අයත් වන සේ අන්තිම කැමති පත්‍රයක් අත්සන් කොට පවරා දුන් අයෙකුවීම ද විශේෂය. ධර්මපාල කුමරාගේ නම මෙම සෙල්ලිපියෙහි සඳහන් කරන්නට ඇත්තේ වීධීයබණ්ඩාර තම පුත්‍රයා පිළිබඳ ඇති අසීමිත ආදරය නිසා බැව් සිතිය හැකිය. රාජාවලිය විස්තරකරන පරිධී සත්කෝරළයේ බලය ලබාගැනීමෙන් පසු වීදියබණ්ඩාර කොළඹ පෘතුගීසීන්ට හා තම පුත්‍ර ධර්මපාලට ලිපි යවා ඔවුන්ගේ ද සහායයෙන් සේනා සන්විධානයකොට සීතාවකට විරුද්ධව සටන්කොට ඇත (එම:234). මෙයින් පෙනෙන්නේ ඔහු සත් කෝරළයේ බලය ලබාගැනීමෙන් පසු  තම පුත්‍ර ධර්මපාල කුමරු සමග මිත්‍රශීලීව සමීප ඇසුරක් පවත්වාගෙන ගිය බවය. එබැවින් මෙම ලිපියෙහි ධර්මපාල රජුගේ නම සටහන් කිරීමට සුදුසු වාතාවරණයක් එකල ගොඩනැගී තිබුණුබව පැහැදිළි වේ. ඔහු 1597 දී මිය ගියේය.

***කදුරුගම ආරච්චි :***මොහු වීධීය බණ්ඩාර සහ ධර්මපාල කුමාරයගේ සමයෙහි ඔවුන්ට හිත පක්ෂපාතීව සිටි අයෙකු බව මෙම ලිපියේ ඔහුගේ නම ද සටහන්ව තිබීමෙන් පෙනීයයි. මෙම පුද්ගලයාගේ සංඥා නාමය නොදක්වා ඒ වෙනුවට ගමෙහි නම දක්වා තිබේ. ඔහු පාලන තන්ත්‍රයට සම්බන්ධ අයෙකු බව පැහැධීලි වේ. **ආරච්චි** යන පදය ද්‍රවිඩ භාෂාවේ **අරෛරොච්චි** යන පදයෙන් සිංහලට පැමිණි බවත් යුධ සේනාංකයක නැතහොත් අතපත්තුවක හෝ හේවා වසමක ප්‍රධානියා සඳහා මෙම තනතුරු නාමය යෙදෙන බවත් එය පහත රට ප්‍රදේශයේ මුහන්ධිරම් තනතුරකට දෙවැනි බව ද විදානේ තනතුරකට වඩා උසස් බව ද මහාචාර්ය ඒ වී සුරවීර විසින් පෙන්වා දී ඇත (රාජාවලිය 1997: ගැටපද විවරණය 281). මෙම කදුරුගම ආරච්චි යනු යනු කවරෙක්දැයි කිසිදු මූලාශ්‍රයක සඳහන්ව නැත. ඇතැම් විට ඔහු දේවමැධී කෝරළයේ සිටි **වේළායුධ ආරච්චියා** වීමට ඉඩ ඇත. රාජාවලියට අනුව මුණුඩකොණ්ඩපොළ නුවර එධිරිමාන්නසූරිය රජු කුමන්ත්‍රණය කොට මරා වීධීයබණ්ඩාරට එහි බලය ලබා දීමට කටයුතු කරන ලද්දේ වේලායුධ ආරච්චියා විසිනි (රාජාවලිය 253). මෙම සිද්ධියම විස්තර කරන කුරුණෑගල විස්තරය කෘතියෙහි සඳහන්ව ඇත්තේ **නවගත්තේරාළ** යනුවෙනි (කුරුණෑගල

විස්තරය). වේලායුධ ආරච්චිගේ ගමෙහි නමින් එහි නවගත්තේරාළ යනුවෙන් සඳහන්වූයේ දැයි කෙනෙකුට තර්ක කළ හැකිය.

මායාදුන්නේගේ අවසරයෙන් මුණ්ඩකොණ්ඩපුර නගරයට වැද වීධියබණ්ඩාර සමග යුධ වධීන **රාජසිංහ කුමරු** වීධියබණ්ඩාර පුත්තලමට පළවා හැර එධිරිමාන්න සූරිය රජුට හඩිකරපු වේලායුධ ආරච්චියා අත් අඩංගුවට ගෙන උල හිඳුවා මරා දමන ලද්දේ යැයි රාජාවලිය කියයි (රාජාවලිය1997: 253).

***දේවොමැදි කෝරළය*** **:**මෙය වර්තමාන වයඹ පළාතේ කුරුණෑගල ඩිස්ත්‍රික්කයට අයත්ය. රාජාවලියෙහි මෙය හඳුන්වා ඇත්තේ **සත්කෝරළයෙ දේවමැද්ද** යනුවෙනි (එම:234).**ශ්‍රී ලංකාවීපයේ කඩයිම් පොතෙහි දැදුරු ඔය** හා **මගුරු ඔය** යන ඕ දෙකට මැධිව දේවමැද්ද රට පිහිටා තිබෙන බව එච්.ඒ.පී. අභයවර්ධන උපුටා දක්වයි. ඒ හැර එම ලේඛනවල ඇතැම් ගම්වල සීමා දැක්වීමේ දී ගිරවුන්, මොණරුන්, වඳුරන් කෙටූ ගල්ටැම් තිබෙන බවත් දක්වයි (අභයවර්ධන 1978:90). **දෙ-ඕ-මැද** යන්නෙහි ම රූපාන්තරයක් ලෙස **දේවමැද්ද** යන්න සැකසෙන්නට ඇතැයි එතුමා වැඩි දුරටත් සඳහන් කරයි (එම:90). දේවමැධිරට ප්‍රාදේශිය රාජ්‍යයක් වූබවත් මුණඩිකොණ්ඩපොළ එහි ප්‍රධාන නගරය හා ප්‍රාදේශීය රාජධානිය වූ බවත් අනුමාන කළ හැකි බවත් එතුමා වැඩිදුරටත් සඳහන් කරයි (එම: 91).

***වඳුරන් රිළවුන් වවුලන් නොමරනුවා*** **:**මෙම ශිලාලේඛනයෙහි වඳුරන් රිළවුන් සහ වවුලන් නොමරන ලෙස අවධාරණය කොට ඇත. ලංකාවේ මෙතෙක් කිසිඳු ශිලාලේඛනයක මෙම සත්ත්වයන් තුන් දෙනා නොමැරිය යුතු බවට ආඥා පනවා නැත. එහෙත් නිශ්ශංකමල්ල රජුගේ ඇතැම් ශිලාලේඛනවල පොදුවේ සිවුපා සතුන්, පක්ෂීන් සහ මහ වැ තන්හි මත්ස්‍යයින්ට අභය ධියයුතු බව සඳහන් කර ඇත(Ranawella 2007:77). නාථගනේ මෙම ශිලාලේඛනයෙහි මෙම සත්ත්ව කොට්ඨාස තුන විශේෂ කොට දක්වූයේ කවර කරුණක් නිසා දැයි පැහැධිලි නැත. මොවුන් ඇතැම් විට එකල ජනතාව විසින් තම වගාවන්වලට හානි කරනු ලබන පලිබෝධකයින් ලෙස සලකා විශාල වශයෙන් ඝාතනය කරමින් තිබුණා විය හැකිය. ඉහත දක්වන ලද පරිධි දේවමැධි කෝරළයේ ඇතැම් ගම් සීමා දැක්වීමේ දී වඳුරු රුව ගල් කණුවල කොටා තිබුණු බව ද සඳහන් කෙරුණි. මෙම ක්ෂීරපායි සත්ත්වයින් තුන් පළඝාතනය නොකිරීම හේතුකොට ගෙන ලැබෙන පුණ්‍ය ඵලය වීධිය බණ්ඩාර රජුටත්,ධර්මපාල රජුටත්, කඳුරුගම ආරච්චියාටත් ලැබෙන බව දක්වා තිබීමෙන් මෙය කිසියම් විධියක රාජ ආඥාවක් ලෙස පැනවූ බව පෙනීයයි. සැලකිය යුතු තවත් කරුණක් වන්නේ ඒ වන විටත් ධර්මපාල කුමරු ක්‍රිස්තු සමය වැළඳගෙන තිබුණේ වී නමුත් ඔහුට බෞද්ධාගමික චාරිත්‍රයට අනුව පින් ලබා දී ආශිර්වාද ප්‍රාර්ථනා කිරීමට මෙය පිහිටුවන ලද අයවලුන් විසින් උත්සාහකොට

තිබීම ය. මේ අනුව මෙම ශිලාලේඛනය ලංකාවේ ඇති දුර්ලභ ලේඛනයක් ලෙසත් එය ඉතිහාසය අධ්‍යයනය කරන්නවුන්ගේ අවධානයට ලක්විය යුතු බවත් සඳහන් කළ හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


අභයවර්ධන, එච්.ඒ.පී. (1978), *කඩයිම්පොත් විමර්ශන*, සංස්කෘතික දෙපාර්තමේන්තුව, කොළඹ.

*අලකේශ්වර යුද්ධය* (2009), සංස්. ඒ.වී. සුරවීර, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

කන්නන්ගර, පත්මසිරි (2014), *සියවසක උරුමය, ප්‍රාචීන ප්‍රාරම්භ සාහිත්‍ය සමීක්ෂා* සංස්. අළුත්ගම ධම්මපාල හිමි, ප්‍රින්ට්විච් ප්‍රින්ටින් සර්විස්, ගංගොඩවිල.

*කුරුණෑගල විස්තරය* (2015), සංස්. රංගන කුරුවිට. සූරිය ප්‍රකාශකයෝ, මරදාන.

Paranavitana, S. (1970), *Inscriptions of Ceylon,* Vol.I, Archacological survey of Ceylon, Colombo.

Paranavitana, S. (1933), *Ceylon Journal of Science*, Vol. II, Part 3, London.

Ranawella, S. (2007), *Inscriptions of Ceylon*, vol. VI, Archacological Survey of Ceylon, Colombo.

රණවැල්ල, සිරිමල් (2015), *අසිරිමත් කෝට්ටේ*, සංස්. එස්. බී. හෙට්ටිආරච්චි ඇතුළු පිරිස, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

*රාජාවලිය* (1997), සංස්. ඒ.වී. සුරවීර. අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, කොළඹ.

*රිබෙයිරෝගේ ලංකා ඉතිහාසය* (2003), සංස්. ටී.කේ. රුබේරු, ඇස්. ගොඩගේ සහ සමාගම.

සුමනජෝති හිමි, දෙගම්මැද (2005), *කුරුණෑගල්පුර යුගය*, (දෙවන මුද්‍රණය) රත්න ප්‍රකාශකයෝ, කොළඹ.

සෝරත හිමි, වැලිවිටියේ (1963), *සුමංගල ශබ්දකෝෂය*, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම,කොළඹ.

